**Import &Sell**

**1995 අංක 35 දරණ මිනුම් ඒකක,ප්‍රමිති හා සේවා පනතේ 21 වගන්තිය යටතේ වෙළඳාම සඳහා භාවිතා කරන යම් පඩියක්,මිම්මක් හෝ කිරන හෝ මනින උපකරණයක් <u>ආනයනය කර විකිණීම</u> සඳහා ලියාපදිංචි සහතිකයක් අයදුම් කිරීම.**

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ
මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව,
මාහේනවත්ත, පිටිපන,
හෝමාගම.

ඉහත සඳහන් ලියාපදිංචි සහතිකයක් මා වෙත නිකුත් කරන ලෙස මෙහි පහත අත්සන් කරන මම ඉල්ලා සිටිමි.

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :.............................................................................................................
    (ඉංග්‍රීසියෙන්) :.............................................................................................................
    ලිපිනය :.............................................................................................................
    (ඉංග්‍රීසියෙන්) :.............................................................................................................
    හැඳුනුම්පත් අංකය :.............................................................................................................
    දුරකථන අංකය :.............................................................................................................
    දිස්ත්‍රික්කය :.............................................................................................................

02. වෙළඳ ආයතනයේ නම :.............................................................................................................
    ලියාපදිංචි අංකය :.............................................................................................................

03. මීට පෙර ලියාපදිංචි සහතිකයක් ලබා ගෙන තිබේ නම් එහි අංකය සහ දිනය :.............................................................................................................

04. යම් පඩියක්, මිම්මක් හෝ කිරණ හෝ මනින උපකරණයක් ආනයනය කර විකිණීම සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තුව පහත දැක්වේ.ඔබට අදාල උපකරණ වර්ගය / වර්ග ඉදිරියෙන් ( × ) ලකුණු කරන්න.

| | | | |
|---|---|---|---|
| I. | ලී වලින් හෝ ලෝහයෙන් තනන ලද දිග මැනීමේ / ධාරිතාව මැනීමේ මිම් | රු.2,400.00 | |
| II. | පඩි | රු.4,800.00 | |
| III. | තරාදි දඬු | රු.4,800.00 | |
| IV. | දුනු තරාදි | රු.4,800.00 | |
| V. | සමබර තරාදි | රු.4,800.00 | |
| VI. | වේදිකා තරාදි (යාන්ත්‍රික) | රු.4,800.00 | |
| VII. | පාලම් තරාදි (යාන්ත්‍රික සහ ඉලෙක්ට්‍රොනික) | රු.18,000.00 | |
| VIII. | ඉලෙක්ට්‍රොනික කිරුම් උපකරණ | රු.7,200.00 | |
| IX. | ඉන්ධන පිරවුම් උපකරණ | රු.7,200.00 | |
| X. | විද්‍යුත් මිනුම් උපකරණ | රු.7,200.00 | |

05 ආනයනය කරනු ලබන උපකරණ පිළිබඳ විස්තර.

අදාල වන පරිදි වගුව 1 හෝ වගුව 2 සම්පූර්ණ කළ යුතුය.

<u>**ලියාපදිංචි කිරිමේ කොන්දේසි**</u>

1. බලය දෙන ලද පඩි, මිනුම් හෝ කිරුම් මිනුම් උපකරණයක් ආනයනය කර විකිණීම සඳහා ලියාපදංචි කිරිමේ සහතිකය දරන්නෙකු හෝ ආයතනය විසින් පරීක්ෂකවරයා විසින් මුද්‍රා තබන ලද කිරුම් පඩි, මිනුම් හෝ කිරුම් මිනුම් උපකරණ පමණක් විකිණීම හෝ විකිණීමට සඳහා ළඟ තබාගත යුතුය.පරික්ෂකවරයා විසින් නිකුත් කරන සත්‍යාක්ෂණ සහතිකය උපකරණ මිලදී ගන්නා වෙත නිකුත් කල යුතුය.

2. මෙහි සඳහන් කරන කාර්මික නිලධාරියා මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රවීණතා සහතිකය ලබා ඇති අයකු විය යුතුය.

3. ලියාපදිංචි වු කාර්මික නිලධාරියා මියගියහොත් හෝ ආයතනයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ රෝගාතුර වීම නිසා හෝ ශාරීරික නැතහොත් මානසික දුර්වලතාවයක් නිසා හෝ සේවය කළ නොහැකි වුවහොත් හෝ ලියාපදිංචි වු කාර්මික නිලධාරි තනතුර පුරප්පාඩු වු එවිට නව කාර්මික නිළධාරියෙකු පත් කර ඒ බව මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතුය. නැතහොත් ආයතනයේ ලියාපදිංචිය අවලංගු වේ.

4. ආනයනය කර විකුණන හෝ ආනයනය කර විකිණීම සඳහා ඉදිරිපත් කරන සියලුම බලය දෙන ලද පඩි, මිනුම් හෝ කිරුම් මිනුම් උපකරණ සමඟ වලංගු සත්‍යාක්ෂණ සහතිකයක් තිබිය යුතුය.

5. ලියාපදිංචි සහතිකය ලබාගැනීමෙන් පසුව නව මාදිලි සඳහා අනුමැතිය ලබා එම මාදිලි වල උපකරණ ආනයනය කර විකුණන්නේ නම් ඒ බව ලිඛිතව මිනුම් ඒකක,ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතුය. අවශ්‍ය වේ නම් එම මාදිලි සඳහා නව ලියාපදිංචි සහතිකයද ලබා ගත යුතුය.

6. ආනයනය කරනු ලබන උපකරණ මූලික සත්‍යාක්ෂණය සඳහා ඉදිරිපත් කිරීමේදී, එම උපකරණ මාදිලි අනුමැතිය ලබා ගන්නා අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද නිෂ්පාදන ආයතනය මඟින්ම ගෙන්වනු ලබන බව තහවුරු කර ගැනිම සඳහා එම කිරුම් මිනුම් උපකරණ රේගුවෙන් නිදහස් කරගන්නා ලද ලිපි වල පිටපත් ඉදිරිපත් කල යුතුය.

7. මෙම කොන්දේසි සපුරාලීම පැහැරහැරි අවස්ථාවක සහතිකය දරන්නාගේ හෝ ආයතනයේ ලියාපදිංචිය අවලංගු කිරිමට අධ්‍යක්ෂවරයාට හැකිය.

| |
|---|
| **ලියාපදිංචි ගාස්තුවේ වටිනාකමට අදාල ලදුපත/ මුද්දර මෙහි අලවන්න.** |

ගෙවු මුදල / ඇලවු ලදුපත වල වටිනාකම ....................................................................................................

දිනය :..................................................  අත්සන :............................................

වගුව 01

සම්පූර්ණ උපකරණය ආනයනය කර නිෂ්පාදකගේ සන්නාමය යටතේ විකිණීම.

| උපකරණ වර්ගය | ආනයනය කරන රට | නිෂ්පාදක හා මාදිලිය | මාදිලි අනුමැතිය ලැබූ වර්ෂය | කාර්මික නිලධාරියාගේ නම |
|---|---|---|---|---|
| | | | | |

වගුව 02

එකම නිෂ්පාදකයාගෙන් සියළුම උපාංග ආනයනය කර එකලස් කර නිෂ්පාදකගේ සන්නාමය යටතේ විකිණීම.

| උපකරණ වර්ගය | උපාංග සපයන නිෂ්පාදක /රට | මාදිලිය සහ මාදිලි අනුමැතිය ලබා ගත් වර්ෂය | ගෙන්වන උපාංග | කාර්මික නිළධාරියාගේ නම |
|---|---|---|---|---|
| | | | | |

සටහන

01. මාදිලි අනුමැතිය ලබාගන්නා අවස්ථාවේදී දන්වන ලද පරිදි අදාල උපාංග එම සැපයුම්කරුවන්ගෙන්ම අදාල පිරිවිතරයන්ට අනුව ලබා ගත යුතුය.

02. දැනට සම්පූර්ණ වශයෙන් ආනයනය කරන උපකරණය කොටස් වශයෙන් ගෙන්වා එකලස් කරන්නේ නම් වෙනම අනුමැතිය ලබා ගතයුතු අතර, එකලස් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ අධ්‍යක්ෂවරයා සෑහීමකට පත් වන ආකාරයට කාර්මික නිළධාරියා, කර්මාන්තශාලාව පවත්වා ගත යුතුය.